(15)

දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක : 03/2015

මගේ අංකය :- DAPH/AD/25/5/11"

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,

පේරාදෙණිය,

2015.05. 20

1. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
2. සියළුම අධ්‍යක්ෂවරුන්,
3. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සියළුම පශු සම්පත් සංවර්ධන නිලධාරීන් ,

**<u>පශු සම්පත් සංවර්ධන නිලධාරීන් යලි ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවට අන්තර්ග්‍රහණය කිරීමේදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2008 ට අනුකූලව පෙරදාතම් කර ගැනීම</u>**

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සිට 2001.07.03 දින සිට ඉන් ඉවත් වී මධ්‍යම රජයේ පශු සම්පත් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වී, නැවත 2012.02.09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අන්තර්ග්‍රහණය කරන ලද පශු සම්පත් සංවර්ධන නිලධාරීන්ට , 2008.02.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2008 මගින් ඇති වී ඇති වැටුප් විෂමතාව ඉවත් කිරීම සඳහා 2014.09.04 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළැඹි තීරණය පරිදි පහත සඳහන් අයුරින් ක්‍රියා කරන ලෙස, සමාජසේවා, සුබසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MLRCD/05/08/17-01 හා 2015.03.20 සහ 2015.05.15 දිනැති ලිපි සමඟ පිළිවෙලින් එවා ඇති රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශයේ ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ESTS/1/22(II) හා 2015.03.06 සහ 2015.05.09 දිනැති ලිපි මගින් දැනුම් දී ඇති බව කාරුණිකව දන්වමි.

i. 2012.02.09 දින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට නැවත අන්තර්ග්‍රහණය වූ පශු සම්පත් සංවර්ධන නිලධරයන්ගේ වැටුප් විෂමතාව ඉවත් කිරීමේ කාර්යය සඳහා පමණක්, එම නිලධරයන් 2001.07.03 දින සිට ක්‍රියාත්මක වූ මධ්‍යම රාජ්‍ය සේවයේ පශු සම්පත් සංවර්ධන නිලධාරී සේවයට අයත් නිලධරයන් ලෙස නොසැලකීම.

ii. ඉහත (i) හි සඳහන් නිලධරයන් මධ්‍යම රජයේ පශු සම්පත් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වූ 2001.07.03 දින සිටම ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සිටි නිලධරයන් ලෙසත්, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අදාළ වැටුප් ක්‍රම හා උසස් වීම් ලබා දී ඇති ලෙසත් සලකා ඒ අනුව සියළුම වැටුප් පරිවර්තන කල්පිත පදනමින් සැකැසීම.

iii. ඉහත පරිදි ක්‍රියා කිරීම වැටුප් පරිවර්තන කාර්යය සඳහා පමණක් අදාළ කර ගැනීම හා එම කාර්යය හැර අනෙකුත් සියළු කාර්යයන් සඳහා එම නිලධරයන් නැවත ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට සත්‍ය වශයෙන් අන්තර්ග්‍රහණය වූ දිනය අදාළ කර ගැනීම.

iv. ඉහත (ii) පරිදි වැටුප් පරිවර්තන සිදු කිරීමෙන් පසුව හිඟ වැටුප් ගෙවීමකින් තොරව, 2014.09.04 දින අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇති පරිදි එදින සිට සංශෝධිත වැටුප ගෙවීම.

v. ඉහත විධිවිධාන වලට යටත්ව 2001.07.03 හා එදිනට පසුව විශ්‍රාම ලබා ඇති නිලධරයන් සඳහා ද හිඟ වැටුප් ගෙවීමකින් තොරව, 2014.09.04 දින සිට සංශෝධිත විශ්‍රාම වැටුප ගෙවීම.

සත්‍ය පිටපතක් බවට
සහතික කරමි.

..............................

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය
අධ්‍යක්ෂ ජනරාල්
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපා.
තැපැල් - පේරාදෙණිය

vi. ඉහත කරුණු ඇතුලත් කරමින් අදාළ නිලධාරයන් දැනුවත් කිරීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කිරීම.

වෛද්‍ය ඩී.ආර්.ටී.ඒ. රත්නායක,

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)

<u>පිටපත්</u> :-

01. ලේකම්, සමාජසේවා, සුබසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය - ඉහත කරුණ සම්බන්ධයෙන් වූ ඔබගේ යථෝක්ත 2015.03.20 සහ 2015.05.15 දිනැති ලිපි අනුව කාරුණික දැ.ගැ.ස.